අඹන්ගඟකෝරලේ ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 14 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අඹන්ගඟකෝරලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු රු.160,500 ක මුද්දර ගාස්තු ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ රු.123,775 ක් වටිනා ටයර් හා වාහන බැටරි ඇතුළත් කර තිබුණි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | පෙර වර්ෂවලට අදාළව ලැබී තිබූ රු.90,070 ක මුළු පොළී මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ සලකා ගිණුම්ගතකර තිබුණි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගිවිසුම්ගත නොවූ රු.550,000 ක් වටිනා ව්‍යාපෘති 08 ක වටිනාකම ණයහිමියන් යටතේ ගිණුම්ගතකර තිබුණි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | කර්මාන්ත ඇප රැඳවුම් ශේෂයක් නොමැති වුවත් මූල්‍ය ප්‍රකාශන තුළ රු.40,803 ක් ලෙස දක්වා තිබුණි. | සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම ශේෂය 2013/12/31 අවසන් ගිණුමේ සිට පැවැති ශේෂයකි. මෙම ශේෂය පිළිබඳව කමිටුවක් මගින් තොරතුරු සොයමින් පවති. |

### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **ලැබිය යුතු ගිණුම්** | | |
| | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතු වටිනාකම රු.31,790,435 ක් වූ අතර, වර්ෂ 01 ට වැඩි හා 05 ට අඩු රු.208,491 ක් ද වර්ෂ 05 ට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකළ රු.2,991,645 ක් ද ඊට ඇතුළත්ව තිබුණි. | ලැබිය යුතු ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ලැබිය යුතු ආදායම් සියල්ල කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | **ගෙවිය යුතු ගිණුම්** | | |
| | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක වටිනාකම රු.29,355,898 ක් වූ අතර, වර්ෂ 01 ට වැඩි හා 05 ට අඩු රු.363,355 ක් ද වර්ෂ 05 ට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින රු.1,689,632 ක් ද ඊට ඇතුළත්ව තිබුණි. | ගෙවිය යුතු මුදල් ගෙවීමට හා නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ගෙවිය යුතු වියදම් සියල්ල කඩිනමින් ගෙවීමට අවශ්‍ය කටයුතු කරමි. |

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------------

තොරතුරු ඉදිරිපත් නොකිරීම

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එකතුව රු.3,530,691 ක් වූ ගිණුම් විෂයයන් 13 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් විෂයන්වලට අදාළ උපලේඛන හා ලිපිගොනු පිළියෙල කළ යුතු වේ. | මෙම ගිණුම් විෂයයන් 13 ට අදාළව තොරතුරු සොයා ගැනීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම්

-------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 | ආපදා ණය මුදල් ලබා දිය හැකි උපරිම සීමාව රු.250,000 ක් වුවත්, එම සීමාව ඉක්මවා නිලධාරීන් 5 දෙනෙකුට ආපදා ණය මුදල් ලබාදී තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | චක්‍රලේඛය අනුව මින් ඉදිරියට කටයුතු කරමි. |
| (ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 | වාහන 8 ක ඉන්ධන දහන පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු යොදා ඇත. |
| (ආ) 2018 සැප්තැම්බර් 14 දිනැති අංක මප/ප.ප.කො./2018/08 දරන මධ්‍යම පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | සභාවේ නිලධාරීන්ගේ හා සේවකයන්ගේ පැමිණීම හා පිටවීම සළකුණු කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | ඇඟිලි සලකුණු යන්ත්‍රය ස්ථාපිත කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.415,614 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.803,539ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 27,500 | 17,566 | 17,431 | 3,886 | 101,000 | 12,005 | 10,258 | 50,638 |
| (ii) | කඩ කුලී | 215,000 | 122,840 | 123,360 | 19,820 | 147,000 | 96,600 | 105,030 | 16,160 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 396,000 | 364,505 | 364,505 | - | 335,100 | 294,016 | 294,016 | - |
| (iv) | වෙනත් ආදායම් | 5,496,600 | 4,033,215 | 4,031,088 | 1,672,702 | 4,926,732 | 3,276,844 | 3,276,844 | - |
| | එකතුව | 6,135,100 | 4,538,126 | 4,536,384 | 1,696,408 | 5,509,832 | 3,679,465 | 3,686,148 | 66,798 |

2.2.2 ජල ගාස්තු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පාරිභෝගිකයන් 18 කගෙන් අයවිය යුතු ජල ගාස්තු ශේෂය රු.71,730 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතු වේ. | හිඟ ජල ගාස්තු අය කිරීමේ ජංගම කාර්යාල ආරම්භ කර අය කිරීමට කටයුතු කරමි. |
| (ආ) | වර්ෂ අවසානයට පැවැති හිඟ ශේෂය තුළ ජල සම්බන්ධතා විසන්ධි කළ පාරිභෝගිකයන් 52 කගෙන් අයවිය යුතු රු.91,270 ක් පැවතුණි. | හිඟ ආදායම් අයකර ගත යුතු වේ. | හිඟ හිට ඇති විසන්ධි කළ ස්ථාන සඳහා සමථමණ්ඩලයට යොමු කිරීමට මූලික කටයුතු සිදුකර ඇත. |
| (ඇ) | ජල යෝජනා ක්‍රම 08 හි ජලයේ පිරිසිදුභාවය පිළිබඳ රසායනාගාර පරීක්ෂණයන් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගුණාත්වයෙන් යුතු පිරිසිදු පානීය ජලය නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ. | හැකි ඉක්මනින් ජල සාම්පල් පරීක්ෂා කොට තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබාදෙන ලෙස ලිඛිතව ඉල්ලා ඇත. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.375,367 ක් සහ මුද්දර ගාස්තු රු.1,032,100 ක් විය. | ලැබිය යුතු ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු සියල්ල කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අත්හැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රු.550,000 ක් වටිනා සංවර්ධන යෝජනා 08 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | සැලසුම් කළ කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අදාල කාලය තුළ ව්‍යාපෘති වැඩ අවසන් නොකිරීම නිසා ග්‍රාම ශක්ති ගම්මානවල සංවර්ධන ව්‍යාපෘති 19 කට අදාළ රු.14,400,000 ක් වූ ප්‍රතිපාදන ආපසු යැවීමට සිදුව තිබුණි. | කාර්යක්ෂමව සැලසුම් සහගතව කටයුතු සිදු කළ යුතු වේ. | ඇස්තමේන්තු සකස් කිරීමට කාලයක් ගතවීම, ඇස්තමේන්තු අනුඥාත වී සභාව වෙත ලැබීමට ප්‍රමාද වීම, මැතිවරණ කාලයක් පැවතීම යනාදී හේතු නිසා ව්‍යාපෘති 19 ක් ක්‍රියාත්මක කර අවසන් කිරීමට නොහැකි වූ බැවින් ප්‍රතිපාදන සභාවට අහිමි විය. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීමක් සිදුකර නොතිබූ අතර, ඊට අදාළ සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි. තිරසර සංවර්ධන ඉලක්ක ළගාකර ගැනීම සඳහා අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | චක්‍රලේඛය පිළිබඳව දැනුම ලබාගෙන ඉදිරි වර්ෂය සඳහා තිරසර සංවර්ධන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂ 3 ක් තුල සංවර්ධන බලපත්‍ර 36 ක් නිකුත් කර ඇතත්, එම කිසිදු ගොඩනැඟිල්ලකට අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. අනුමැතිය ලබා නොදුන් අයදුම්පත් 60 ක් සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි. | අනුකූලතා සහතික නිකුත් කිරීමට හා අනුමැතිය ලබා නොගත් අයදුම්පත්‍ර සම්බන්ධව පසු විපරම් කටයුතු සිදු කළ යුතු වේ. | කරුණු සොයා බලා අනුකූලතා සහතික නිකුත් කිරීමටත්, අනුමැතිය ලබා නොගෙන අනවසර ඉදිකිරීම් කර ඇද්ද යන්න පසු විපරම් කර අදාළ කටයුතු කරන ලෙසත් විෂය නිලධාරීට උපදෙස් ලබාදෙන ලදී. |
| (ආ) | 1996 වර්ෂයෙන් පසුව ඉදිකර තිබූ මාර්ග ගැසට්පත්‍රයේ පළකර ඉන්වෙන්ට්‍රි ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කළ යුතු වේ. | මිනුම් කටයුතු කිරිම සඳහා අවශ්‍ය වන වියදම් මෙන්ම ප්‍රවාහන පහසුකම් සලසා ගැනීමේ දුෂ්කරතාවයන් මත මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීමට නොහැකි විය . |

3.3 මානව සම්පත් කළමනාකරණය
------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්යමණ්ඩලයේ තනතුරු 7 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් පිළියෙලකර නොතිබූ අතර, වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් ද අත්සන්කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ රු.296,945 ක් වූ ආපදා ණය ශේෂය හා රු.7,500 ක උත්සව අත්තිකාරම් ශේෂය පියවා ගැනීමට කටයුතුකර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිලධාරීන් දෙදෙනාගේ ආපදා ණය මුදල් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

3.4 වත්කම් කළමනාකරණය
-----------------------------

3.4.1 පවරා නොගත් වත්කම්
---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බාහිර ආයතන 03 කින් ලැබී තිබුණු වාහන 03 ක් හා යතුරු පැදියක් පවරා ගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | වාහන සභාව නමට පවරා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. |

3.4.2 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්
----------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බහු කාර්ය ගොඩනැගිල්ල අසළ වූ ළමා උද්‍යානය ළමුන්ට ප්‍රවේශ වීමට අපහසු ස්ථානයක ඉදිකිරීම හේතුවෙන් නිෂ්කාර්යව පැවති අතර, පැරණි පුස්තකාල ගොඩනැගිල්ලක් ද නිශ්කාර්යව පැවතුණි. | ගොඩනැගිලි ඵලදායී කාර්යයන්ට යොදවා ගත යුතු වේ. | ළමා උද්‍යානය ග්‍රාමීය ප්‍රදේශයක පිහිටා ඇති බැවින් ළමුන් නොපැමිණෙන අතර, පැරණි පුස්තකාල ගොඩනැගිල්ල සංවර්ධනය කර කඩ කාමර ඉදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | රු.10,779,226 ක් වටිනා වාහන 03 ක්, රු.991,500 ක් වූ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක්, යතුරු පැදියක් හා විදුලි ජනක යන්ත්‍රයක් වර්ෂ 06 ක කාලයක සිට නිශ්කාර්යව විනාශ වීමට ඉඩ හැර තිබුණි. | යන්ත්‍ර හා උපකරණ ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම රථ සඳහා රියදුරෙකු යෙදවීම අපහසු වීම හේතුවෙන් ටිපර් රථය හා ඩම්ප් ට්‍රක් රථය නිෂ්කාර්යව ඌන උපයෝජිතව පැවතුණි. සිංගල් කැබ් රථය අලුත්වැඩියා කිරීමට කටයුතු කරමින් පවතින අතර විදුලි ජනක යන්ත්‍රය මෙතෙක් භාවිතා කිරීමට අවස්ථාවක් උදා වී නොමැත. |

3.5 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පුස්සැල්ල මුදුන අංක 01 දරන කඩ කාමරය බදු ගත් තැනැත්තන් විසින් 2015 වර්ෂයේදී යාබදව අනවසරයෙන් කඩ කාමරයක් ඉදිකර තිබුණු අතර, නැවත එම බදුකරු විසින් 2019 වර්ෂයේදී ද අනවසර ඉදිකිරීමක් එම ස්ථානයේම සිදුකර තිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධව නීතිමය පියවර ගත යුතු වේ. | 2019 වර්ෂයට පෙර ඇතිකර ගත් ගිවිසුම් ප්‍රකාරව බදුකරු සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා වන ප්‍රතිපාදන අවම බැවින්, 2019 වර්ෂයේ තක්සේරුවක් සිදුකර නව ගිවිසුම් ප්‍රකාරව කඩ කුලිය අය කර ගැනීමට කටයුතු සිදුකර ඇත. |

3.6 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 15 දින වැඩ අවසන් වී තිබූ මැටිහක්ක කඩ කාමර දෙක ටෙන්ඩර් කිරීමට නොහැකිව වසා දමා තිබීම හේතුවෙන් 2019 අප්‍රේල් 01 සිට දෙසැම්බර් දක්වා කාල පරාසය සඳහා රු.1,581,000 ක අලාභයක් සභා අරමුදලට සිදුව තිබුණි. | විධිමත් පරිදි කටයුතු කර කඩ කාමර බදු දීම කළ යුතු වේ. | මේ දක්වා කර ඇති සියලු කටයුතු මහ සභාව, මුදල් කමිටුව හා ටෙන්ඩර් මණ්ඩලය මඟින් ගන්නා තීරණ වලට අනුකූලව ක්‍රියාකර ඇති බවද කාරුණිකව දන්වමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2019 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් සහ අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි. | විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. | 2019 වර්ෂයේ ආයතනයේ ලේකම් ධූරය වෙනස් වූ බැවින් අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර නොතිබිණි. |
| (ආ) | අභ්‍යන්තර විගණන නිලධාරිනිය වෙත විවිධ විෂය රාජකාරි පවරා තිබීම හේතුවෙන් අභ්‍යන්තර විගණන කටයුතු ප්‍රමාණාත්මකව හා ස්වාධීනව සිදු කිරීමට නොහැකි වී තිබුණි. | අභ්‍යන්තර විගණනය ස්වාධීනව පවත්වා ගැනීම කළ යුතු වේ. | අභ්‍යන්තර විගණන විෂය වෙනත් නිලධාරිනියක් වෙත පවරා ඇති නමුත්, කාර්යමණ්ඩල ඌනතාවය නිසා එම විෂය සම්පූර්ණ ස්වාධීන කිරීමේ හැකියාවක් නොමැති බැවින් මූල්‍යමය වගකීම අඩු විෂයන් පවරා ඇත. |